

දෙව්මි හිමංසා ගාල්ලගේ.

# සිහිනය.

දෙව්මි හිමංෂා ගාල්ලගේ
කතෘ

මහාමායා බාලිකා විදුහල
1 ශ්‍රේණිය E

2026.04.24

# පිදුම.

මහාමායා බාලිකා විදුහලේ මාගේ පංතිභාර ගුරු ඇදුරියන්ටත්, මා හට සහය වූ මාගේ දෙමව්පියන් හට මා මේ කෘතිය ආදරයෙන් පිදුම් ලබන්නෙමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය





චදුව්මි බබා රෑ වෙලා දොයිය
ගන්න ඇඳට යනවා.



නිදාගෙන ඉන්න දෙව්මි බබා ලස්සන
සිහිනයක් දකිනවා එයා උඩට
පාවෙනවා වාගේ.



අනේ.. සතුටින් අහසට යන දෙව්මි බබා
දකිනවා ලස්සනට දිදුලන ඉරයි
හඳයි තරුයි හිනැහෙනවා.



අහසට ගිය දෙව්මි බලා සතුටින්
මේ හිනැහෙන සූර්ය හඳයි එක්ක
යාළු වෙනවා.



ඉතින් එයි තුන් දෙනා ගොඩාක් සතුටින්
වළාකුළු වල හැංගිලා සෙල්ලම් කරනවා.



මේ තුන්දෙනා සතුටින් සෙල්ලම් කරන අතර තුර අහස කළ වෙලා වහින්න ගන්නවා. ඉරයි හඳයි වළාකුළු අතර හැංගිලා. දෙව්මි බබා ගොඩාක් බයවෙලා අඬනවා.



තනිවෙලා අඬන දෙව්මි බලා දකිනවා
ඈතින් කුරුළු රැනක් ඉගිල්ලෙනවා.



තනිවෙලා අඬන දෙව්මි බලා ඒ
කුරුල්ලෙකුගේ ඇඟ උඩට නගිනවා.



එක පාරටම දෙව්මි බබා අර කුරුලු රැලෙන් අතෑරිලා බිමට වැටෙනවා.



එක පාරටම දෙව්මි බබා තිගැස්සිලා
අඬාගෙන ඇහැරෙනවා. ඉතිං ඒ හීනයක්
පහුව දැක්කේ කියලා බබා දැනගන්නවා.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)